**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය - 2023**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) සහ 108(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ නව ගොඩනැගිල්ල ජාලගත කිරීම හා අන්තර්ජාල පහසුකම් සැපයීම වෙනුවෙන් 2023 වර්ෂය සඳහා AHEAD ව්‍යාපෘතියෙන් දරා තිබුණු රු.3,061,415ක් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා දේපල පිරියත හා උපකරණ එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.<br>තවද ජාල පද්ධතිය ස්ථාපිත කිරීමේ ගාස්තු හා කාර්යාල උපකරණ සඳහා බෙදාහැරීමේ පිරිවැය ලෙස AHEAD ව්‍යාපෘතිය මගින් වැය කරන ලද රු.2,552,370ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි. තවද විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ ඉදිකර ඇති මාර්ග පද්ධතිය, මළ ප්‍රවාහන පද්ධති හා සන්නිවේදන පද්ධති ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 07හි 19 ඡේදය අනුව අගයකර දේපළ පිරියත යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | තවදුරටත් සොයා බලා ඉදිරියේ දී අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට කටයුතු කරනු ලබන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 47 ඡේදය ප්‍රකාරව දේපල, පිරියත හා උපකරණවල සාධාරණ වටිනාකම් වෙනස්වීම් සෑම වසර තුනකට හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කළ හැකි වුවද විශ්වවිද්‍යාලය සතු ඉඩම් 2013 වර්ෂයේදී රු.325,750,000 කට ප්‍රත්‍යාගණනය කිරීමෙන් පසු වර්ෂ 10 ක්ද, ගොඩනැගිලි 2016 වර්ෂයේදී රු.3,523,975,000 කට ප්‍රත්‍යාගණනයෙන් පසු වර්ෂ 07 ක්ද ගතවී තිබුණද ඒවා නැවත ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගොඩනැගිලි සඳහා ක්ෂය ප්‍රතිශතය සියයට 05 ක් වන බැවින් 2016 ප්‍රත්‍යාගණනය කරන ලද ගොඩනැගිලි 2035 දක්වා ක්ෂය කරනු ලබන බවත්, මේ වන විට වත්කම් තක්සේරු කිරීම් සඳහා මුදල් අය කරන නිසා ප්‍රත්‍යාගණන කටයුතු සඳහා වසර 03 කට හෝ 05 කට වරක් විශාල පිරිවැයක් දැරීමේ හැකියාවක් නොමැති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට බැඳුම්කර ගිවිසුම් කඩ කළ නිලධාරින්ගෙන් අය විය යුතු රු.21,475,657 ක් ගිණුම් ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේ ගිණුම්වලට ඇතුලත් කරනු ලබන බව. | ලැබිය යුතු ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී සැපයුම්කරුවෙකුගෙන් අයකළ රු.1,898,397ක ප්‍රමාද ගාස්තුව විශ්වවිද්‍යාලයේ ආදායමක් ලෙස හඳුනා නොගෙන ජංගම වගකීමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයේ විශ්වවිද්‍යාල ආදායමට ගෙන ඇති බව. | ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ) | විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් දෙදෙනෙකුගේ තනතුර උසස් කිරීම හේතුවෙන් හිඟ වැටුප් ගෙවීමේදී සිදු වී තිබූ දෝෂ නිවැරදි කිරීමේදී සමුච්චිත අරමුදලට ගැලපිය යුතු රු.818,886ක් වර්ෂයේ වියදමෙන් අඩු කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ වන බව. | වර්ෂයට අදාළ ආදායම් වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්වල බැර ශේෂ පැවතිය යුතු වුවද,සමාලෝචිත වර්ෂයේ, දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන ගිණුම් 05 කට අදාළ එකතුව රු.15,229,232 ක් වූ අසාමාන්‍ය හර ශේෂ දීර්ඝ කාලයක සිට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පැවතුණි. | ගෙවීම් සඳහා බිල්පත් ඉදිරිපත් කළ බැවින් සහ ප්‍රාග්ධන මුදල් ශේෂයන් පැවති බැවින් මෙම ගෙවීම් සිදු කර ඇති බව. | නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළදී බාහිර පාඨමාලාවන්ගෙන් ලැබී තිබුණු රු.11,571,562 ක ආදායම තුළ පෙර වර්ෂයන්ට අදාළව ලැබී තිබුණු රු.1,040,275 ක් හා ඉදිරි වර්ෂ වෙනුවෙන් ලැබී තිබුණ රු.3,977,284 ක් වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය රු.5,017,559ක් වැඩියෙන්ද සමුච්චිත අරමුදල රු.1,040,275 කින් හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරි වර්ෂ වෙනුවෙන් ලැබීම් රු.3,977,284 කින් අඩුවෙන්ද දක්වා තිබුණි. | 2022 වසර දක්වා මුදල් පදනම මත මෙම ගනුදෙනු ගිණුම්ගත කළ බැවින් එම වර්ෂයට අදාළව ලැබුණු ආදායම සහ 2023 වසරේ ලැබුණු ආදායම ගිණුම් ගත කර ඇති බවත්. මෙය ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | වර්ෂයට අදාළ ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුලදී වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන රු.199,345,754ක් මූල්‍ය ප්‍රකාශන තුළ හුවමාරු නොවන ගනුදෙනු වලින් ලද ආදායම ලෙස හඳුනාගැනීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු සඳහා විශ්ව විද්‍යාල වෙත ලබා දුන් ප්‍රතිපාදන ආදායමක් ලෙස ගිණුම්ගත කර ඇති බව. | වර්ෂය තුලදී හුවමාරු නොවන ගනුදෙනුවලින් ලද ප්‍රදානයන්ගෙන් වියදම් කළ ප්‍රමාණය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | 2012 සිට 2019 කාලපරිච්ඡේදය තුළ වැඩ අවසන් කර ඇති කොන්ත්‍රාත් 12 කට අදාළ රැඳවුම් මුදල් රු.49,374,509 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි. | මේ වන විට කොන්ත්‍රාත්කරුවන් විසින් ඉල්ලීම් කර ඇති බිල්පත් ඉංජිනේරු අංශය විසින් පරීක්ෂා කරමින් පවතින අතර ඉල්ලීම් කර නොමැති කොන්ත්‍රාත්කරුවන් වෙත බිල්පත් ඉදිරිපත් කරන ලෙස ලිඛිතව දන්වා ඇති බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය. |
| (ආ) | 2023 ඔක්තෝබර් 03 දිනැති අංක 08/2023 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ සංශෝධිත ආයතන සංග්‍රහයේ 09 වෙනි පරිච්ඡේදයේ 3.1 ඡේදය | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යමණ්ඩලයේ පැමිණීම හා පිටවීම විධිමත් ලෙස තහවුරු කර නොගෙන සමාලෝචිත වර්ෂය තුළ දී වැටුප් හා දීමනා ලෙස රු.1,029,973,587 ක් ගෙවා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ සංශෝධිත ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදය 5.2 වගන්තිය | වැටුප් රහිත නිවාඩු කාලය සඳහා ගණනය කළ යුතු දණ්ඩන මුදල දේශකවරුන් දෙදෙනෙකුගේ ගිවිසුම්වල රු.577,473 ක් අඩුවෙන් හා රු.12,050,096ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කරන ලද වැටුප් රහිත බැඳුම්කර ගිවිසුම් අත්සන් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව | රජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.348,844,768 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.283,361,091 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.632,205,859 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන ස්වරූපයේ වියදම් සඳහා රජයේ ප්‍රදාන ලැබීම්, පුනරාවර්තන ස්වරූපයේ පරිත්‍යාග ලැබීම්, ආයෝජන ආදායම් හා දේපල කුලී ආදායම් වල වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධ්‍යයන නිවාඩු ලබා බැඳුම්කර ගිවිසුම් කඩ කර වසර 01 ත් 20 ත් අතර කාලයක් ගත වී තිබුණු ආචාර්යවරු 08 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු බැඳුම්කර වටිනාකම රු.53,772,566 ක් විය. | අයකර ගත යුතු හිඟ බැඳුම්කර වාරික වශයෙන් අයකර ගන්නා අතර, මුදල් නොගෙවන කථිකාචාර්යවරුන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට කටයුතු කර ඇති බව. | ගිවිසුම් අනුව බැඳුම්කර වටිනාකම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 1999 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලයේ මාකඳුර පරිශ්‍රය පවත්වා ගෙන යනු ලබන අක්කර 22 ක ඉඩම් නීත්‍යානුකූලව විශ්වවිද්‍යාලය වෙත පවරා ගෙන නොතිබුණු අතර 2013 දෙසැම්බර් 31 දිනට තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබාදී තිබුණු එම ඉඩම්වල තක්සේරු වටිනාකම රු.40,000,000 ක් විය. 2023 දෙසැම්බර් 31 දින වන විට ඉඩම් සඳහා භුක්තිය භාරදීමේ සහතිකයක් හෝ(Vesting certificate) ලබා නොගෙන මාකඳුර පරිශ්‍රයේ වටිනාකම රු.2,973.247,723 ක් වූ ගොඩනැගිලි ඉදිකර තිබුණි. | මේ සම්බන්ධයෙන් ප්‍රමුඛත්වය ගෙන කටයුතු කරන ලෙස ප්‍රාදේශීය ලේකම් පන්නල දැනුවත් කර ඇති අතර ඉදිරි කටයුතු පන්නල ප්‍රාදේශීය ලේකම් විසින් සිදු කරනු ඇති බව. | විශ්වවිද්‍යාලය භුක්ති විඳින ඉඩම් නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | පර්චස් 711 ක් පමණ වූ කුඹුරු ඉඩම් 08 ක් පවරා ගැනීම සඳහා රු.1,013,750 ක අත්තිකාරම් මුදලක් හා පොල් පර්යේෂණ මණ්ඩලයට අයත් අක්කර 05ක ඉඩම පවරා ගැනීම සඳහා රු.මිලියන 10 ක මුදලක් පිළිවෙලින් 2013 වර්ෂයේ පන්නල ප්‍රාදේශීය ලේකම් වෙත හා 2013 හා 2014 වර්ෂවල පොල් පර්යේෂණ මණ්ඩලය වෙත ගෙවා වසර 10ක් පමණ ගත වී තිබුණද, එම ඉඩම් විගණිත දිනය වූ 2024 අප්‍රේල් 16 දින වන විටත් විශ්වවිද්‍යාලය වෙත පවරා ගෙන නොතිබුණි. එහෙත් කුඹුරු ඉඩම් 08න් ඉඩම් කැබලි 03ක් විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට අවශ්‍ය නොවන බව විශ්වවිද්‍යාලයේ උපකුලපති විසින් 2022 දෙසැම්බර් 22 දිනැති ලිපිය මඟින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දැනුම් දී තිබුණි. | පන්නල ප්‍රාදේශීය ලේකම්ගෙන් වාචික විමසීමක් කරන ලද බවත්, ඉදිරි කටයුතු පිළිබඳ ඉඩම් අමාත්‍යාංශයෙන් උපදෙස් ලබා ගත යුතු බව ඔවුන් විසින් දන්වා ඇති අතර ඒ අනුව, ඉදිරි කටයුතු පන්නල ප්‍රාදේශීය ලේකම් විසින් සිදු කරන බව. | විශ්වවිද්‍යාලය වෙත ඉඩම් නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1, 2.14.1 නියමයන්ට හා 2020 මාර්තු 25 දිනැති අතිරේක 35 ට (Supplement 35) පටහැනිව මුද්‍රා තැබීමකින් තොරව අතින් රැගෙන එන මිල ගණන් ප්‍රසම්පාදන කමිටුවට යොමු කර 2023 වර්ෂයේ ජනවාරි සිට ජූනි 13 දක්වා සපයන ලද භාණ්ඩ සඳහා රු.2,448,326 ක් ගෙවීම් කර තිබුණි. | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අනුමැතිය මත රු.මිලියන 05 ක් දක්වා අවම වශයෙන් මුද්‍රා තබන ලද මිලගණන් 03 ක් කැඳවා ප්‍රසම්පාදනය කිරීම සඳහා 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.14.1 හා ජාතික ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ 2020 මාර්තු 25 දිනැති අතිරේක 35 මගින් දී ඇති බලය අනුව මෙම ප්‍රසම්පාදනයන් සිදු කර ඇති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලබුයාය වෛද්‍ය පීඨ භූමියේ ඉදිකර 2020 වර්ෂයේ ගිණුම්ගත කර තිබුණු ශ්‍රවණාගාරය (Conference Hall Building) සහ ප්‍රජා මධ්‍යස්ථානය (Community Center) සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අපේක්ෂිත අරමුණු සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | වෛද්‍ය පීඨයේ ශ්‍රවනාගාරය සඳහා අවශ්‍ය පුටු නොමැති වීම නිසා එය භාවිතා කිරීමට අපහසු තත්ත්වයක පැවතුණ බව හා කාර්ය මණ්ඩල හිඟ වීම හේතුවෙන් මේ වන විට ප්‍රජා මධ්‍යස්ථානය ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී ඇති බව. | සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කල යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෛද්‍ය පීඨයේ ඉගැන්වීම් කටයුතු හා ප්‍රායෝගික පුහුණුවීම් කටයුතුවලදී අත්‍යාවශ්‍ය තනතුරු වන අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සහ තාක්ෂණික නිලධාරි හා රසායනාගාර සහයක තනතුරුවල අනුමත සංඛ්‍යාවෙන් සියයට 50කට වැඩි ප්‍රමාණයක් 2023 දෙසැම්බර් 06 දිනට වී පැවතුණි පුරප්පාඩු | හැකි ඉක්මනින් සම්මුඛ පරීක්ෂණ පවත්වා බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කරමින් පවතින බව. | තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතුය. |

**4.** **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රාග්ධන වැය විෂයයන් 05 ක් යටතේ ලැබී තිබුණු ප්‍රතිපාදන ඉක්මවා රු.10,157,907 ක් වියදම් දරා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | අනුමත ප්‍රතිපාදන සීමාව තුළ වියදම් දැරිය යුතුය. |